# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2247/7 - 2021 සැප්තැම්බර් මස 27 වැනි සඳුදා - 2021.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, කොළොන්ගස්වත්ත සේවා ජලාශයට සම්ප්‍රේෂණ නල එළීම සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/103.

2021 අගෝස්තු මස 11 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.


1A - G 34997 — 42 (2021/09)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 701, ඉහළවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොළොන්ගහවත්ත ගමේ පිහිටි, "කොළොන්ගහවත්ත" නැමති ඉඩමෙන් පහත සඳහන් මායිම තුළ පිහිටි පර්චස් 7.5 ක් පමණ වන ඉඩම් කොටස :

**මායිම්**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා ඉඩම දක්වා ඇති ප්‍රවේශ මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | කොළොන්ගහවත්ත සිට මෙම ඉඩම දක්වා ඇති මාර්ගය ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 1. යූ. ඩී. එස්. දොලහාමුන මහතා,
අංක 01, අක්කර 02 කොටස,
කොළොන්ගස්වත්ත,
කෙන්ගල්ල.

10 - 95

---

### 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ගඟ ඉහළ කෝරළේ ජල සම්පාදන ව්‍යාපෘතියේ, ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/102.

2021 අගෝස්තු මස 11 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1053, රාක්ෂාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අලුගොල්ල ගමේ පිහිටි, ක්‍රෙග්හෙඩ් වත්ත නැමති ඉඩමේ පහත සඳහන් මායිම තුළ පිහිටි අක්කර 1, රූඩ් 2ක් පමණ වන ඉඩම් කොටස :

**මායිම්**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | සාලිය මහතා හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ගය ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : සී/ස කහවත්ත වැවිලි සමාගම,
අංක 52,
මාලිගාවත්ත පාර,
කොළඹ 10.

10 - 96

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.